භාෂාව මගින් ජනසමාජයේ චින්තනය කෙරෙහි සිදුකෙරෙනා බලපෑම සුළු කොට තැකිය නොහේ. එසේම ජනසමාජය තුළ භාවිතා වන භාෂාව හැඩගැස්වීමෙහි ලා මාධ්‍ය මගින් සිදුකෙරෙනා බලපෑමද ඒ ලෙසින්ම සුළු කොට තැකිය නොහේ.

මාධ්‍ය තුළ බොහෝ විට භාවිතා වන "ගුරා" වැනි යෙදුම් ප්‍රශ්නකාරී වන්නේ උක්ත කරුණු මුල් කොට ගනිමිනි. ගුරු වෘත්තියේ නියැළෙන්නෙකු සැකකරුවෙකු හෝ වරදකරුවෙකු වන අවස්ථාවන්හිදී "ගුරා" වැනි නිෂේධනාත්මක යෙදුම් භාවිතා කරමින් අදාළ අයවලුන්ව හැඳින්වෙන බව නිරීක්ෂණය කළ හැකි වේ. කෙසේ නමුත් ගැටළුව වන්නේ, මෙවන් නිෂේධනාත්මක, අපහාසාත්මක ස්වරයකින් යුත් යෙදුම් එම සමස්ත වෘත්තියම වෙත එල්ල වීමයි.

මෙවන් නිෂේධනාත්මක යෙදුම් භාවිතා කිරීමෙන් ජනමාධ්‍ය බැහැර විය යුතු නොවේදැයි අප අසන්නේ ඒ හෙයිනි.

**#MediaEthicsSL #lka #SinhalaPress #Divaina #Aruna**
See Less